# සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව

## මොණරාගල දිස්ත්‍රික්කය

-------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 10 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අගෝස්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජූලි 30 වැනි දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

## 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදය දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට සියඹලාණ්ඩුව ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

### 1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු. 943,581 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු. 1,706,396 ක වියදම් වෙනුවෙන් ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) සභාව සතු අංක RX -1452 දරන බවුසරයේ වටිනාකම රු. 715,714 ක් වුවද එය මූල්‍ය ප්‍රකාශනවල රු. 9,000,000 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 8,284,286 ක් වැඩිපුර ගිණුම් ගතකර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු. 151,259 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

1.3.2 **නොසැසඳු පාලන ගිණුම්**

ගිණුම් විෂයන් 09 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 22,155,840 ක් වූ අතර උපයෝගි ලේඛන, උපලේඛන සහ පොදු ලෙජරය අනුව ශේෂය රු. 39,184,973 ක් විය.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

වර්ෂ ගණනාවක සිට අය නොවී පවතින දැනට සේවයේ නොමැති සේවකයින් 09 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 40,013 ක හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම.**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.132,881,045 ක වත්කම් විෂයන් 03 ක් රු.7,650,396 ක වගකීම් විෂයයක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණ කිරීමට නොහැකිවිය.

02. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,321,866 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,689,691 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ අඩුවීම රු. 2,367,825 ක් විය.

## 2.2 <u>ආදායම් පරිපාලනය</u>

### 2.2.1 හිඟ ආදායම්

**සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.14,248,824 ක් වූ හිඟ ආදායම්1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්ති වල විධිවිධාන අනුව අයකර ගෙන නොතිබුණි.**

### 2.2.2 බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂයේදි සභා බල ප්‍රදේශය තුල ස්ථානගත කර ඇති වෙළඳ ආයතන 136 කට වෙළඳ බලපත්‍ර නිකුත් කර ගාස්තු අය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී රු. 170,750 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

### 2.2.3 වෙනත් ආදායම්

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තියේ විධිවිධාන ප්‍රකාර 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති හෝ එම අධිකාරියට අනුමත කර ඇති හෝටල්/ ලැගුම්හල් වලින් අදාළ වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම් වලින් සියයට එක නොඉක්මවන ගාස්තුවක් අතුරු ව්‍යවස්ථා පනවා අයකර ගත යුතු වුවද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන ලැඟුම්හලකින් එසේ ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | <u>රු.</u> |
|---|---|
| උසාවි දඩ | 2,484,970 |
| මුද්දර ගාස්තු | 1,485,400 |

2.2.5 සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු

------------------------------

සභා බලප්‍රදේශයේ විවිධ සමාගම් විසින් 2012 වර්ෂයේ ඉදිකර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 19 කින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ විධිවිධාන අනුව වාර්ෂික බද්දක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද අය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.6 කඩ කාමර කුලී

---------------------

1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ විධිවිධාන අනුව සභාව සතු කඩ කාමර කුලි තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 <u>අධිභාර</u>

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172 (3)වගන්තියේ විධි විධාන යටතේ වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් පනවන ලද අධිභාර අනුව 2014 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණු අධිභාර අගය රු.759,593 ක් විය.

## 03. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

(අ) විදුලිබල අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති ලිපියේ 2.1 වගන්තිය ප්‍රකාරව වීථි ලාම්පු ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා ගාස්තු ගෙවීමේ පදනම මත පළාත් පාලන ආයතන වීථි පහන් ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා සේවා සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කළ යුතු වුවත්, එසේ සිදු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා සභා අරමුදලින් රු. 478,539 ක වියදම් දරා තිබූ අතර වීථි ලාම්පු ස්ථාපනය කිරීමේදී ස්ථාපන ක්‍රමය, සවි කළ යුතු ලාම්පු වර්ගය, සංඛ්‍යාව යනාදිය පිළිබඳව අමාත්‍ය ලේකම්ගේ ලිපිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී වැඩ පරිපාලක, මාර්ග කම්කරු, මුරකරු, පුස්තකාල සහකාර ආදි තනතුරුවල අනියම් හෝ ආදේශක පදනම මත 2001 සිට 2014 දක්වා කාල පරිච්ඡේදය තුල සේවය කරන ලද සේවකයන් 15 දෙනෙකු ස්ථිර සේවයට පත්කර තිබුණ ද ඔවුන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත්ව නොතිබුණි.

## 3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

සභාව සතු වාහන 02 ක් දිර්ඝ කාලයක සිට ධාවනයෙන් ඉවත් කර ඇති අතර මේ සම්බන්ධයෙන් ජනාධිපති ලේකම්ගේ 2013 ජුනි 05 දිනැති අංක පිසිඑම්සි/පිආර්/2013 දරන ලිපියේ විධි විධාන පරිදි කටයුතු කර නොතිබුණි**.**

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

### 3.3.1 දෙවන ප්‍රජා සංවර්ධන හා ජීවන මාර්ග වැඩි දියුණු කිරිමේ ව්‍යාපෘතිය

ප්‍රාදේශීය සභා අන්තර් ගම්මාන සංවර්ධන වැඩ සටහන යටතේ අනුමත වන උප ව්‍යාපෘතීන්ට අරමුදල් සැපයීම සඳහා ප්‍රාදේශීය සභාව හා දෙවන ප්‍රජා සංවර්ධන හා ජීවන මාර්ග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය අතර 2013 නොවැම්බර් 21 දින ගිවිසුමකට එළඹ තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ රු. 52,683,560 ක් නොඉක්මවන මුදලක් ලැබීමට ප්‍රාදේශීය සභාව සුදුසුකම් ලබා තිබුණි.

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) මෙම ව්‍යාපෘතිය සඳහා අවස්ථා 02 කදී රු. 5,911,598 ක මුදලක් පෞද්ගලික ආයතනයකට ගෙවා තිබුණි.

(ආ) ගිවිසුමේ 6 වන වගන්තිය ප්‍රකාරව ක්‍රියාකාරකම් , ක්‍රියාකාරකම්වල සාරාංශය, වියදම් සාරාංශය, ක්‍රියාත්මක කිරීමේ පියවර සහ උප ව්‍යාපෘති යෝජනාවලට අරමුදල් සැපයීමට අදාල වූ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ගිවිසුමේ 9 වන වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘති අරමුදල් නිදහස් කිරීමේදී ඉටු කරනු ලැබූ වැඩ කොටස් මිනුම් ගෙන ගෙවීම් කිරීමේ පදනම මත සිදු කරන බව සඳහන්ව ඇතත් ඉහත ගෙවීම් සම්බන්ධව මිනුම්පත් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) මෙලෙස මිලදී ගන්නා ලද පිවිසි ජලනල හා අනෙකුත් ද්‍රව්‍යවලින් රු. 1,430,850 ක වටිනාකමින් යුත් කොටසක් එනම් මුතුකණ්ඩිය දෙවන ගම්මානයේ මුතුශක්ති ප්‍රජා මූල සංවිධානය වෙත නිකුත් කරන ලෙස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සියඹලාණ්ඩුව ස්ථාන භාර නිලධාරිගේ 2014 සැප්තැම්බර් 11 දිනැති ලිපියෙන් ප්‍රාදේශීය සභා ලේකම් වෙත දන්වා තිබූ අතර විෂය භාර නිලධාරියා විසින් ඒ අනුව ජලනල හා ද්‍රව්‍ය නිකුත් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සම්බන්ධව විස්තරාත්මක ඇස්තමේන්තුවක් හෝ ප්‍රමාණ බිල්පතක් ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) 2014 ජුනි 24 දින මිළදී ගන්නා ලද රු. 4,480,748 ක් වටිනා ජලනල හා ද්‍රව්‍ය අදාළ ව්‍යාපෘති සඳහා යොදා නොගෙන 2015 ජුලි 19 දින වන විටත් සභාවේ භූමියේ ගබඩා කර තිබුණි.

(ඊ) 2013 නොවැම්බර් 21 දින ගිවිස ගන්නා ලද මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට විගණන දිනය වූ 2015 ජුනි 19 වන දින දක්වාම කටයුතු කර නොතිබුණි.

3.3.2 ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති
---------------------------------------

(අ) සමාලෝචිත වර්ෂය තුලදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා පළාත් පාලන අමාත්‍යාංශයේ රු. 5,880,529 ක ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කිරිමට නියමිතව තිබූ සංවර්ධන වැඩ සටහන් 17 ක් කාලය ප්‍රමාණවත් නොවීම හා අධික වැසි සහිතවීම යන හේතු සඳහන් කරමින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) අන්තර් ගම්මාන නියමු ව්‍යාපෘති වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරිම සඳහා සැලසුම් කර තිබූ දොඹගහවෙල විද්‍යුත් පුස්තකාලයට 2012 වර්ෂයේදී ආයතන දෙකකින් අවස්ථා 02 කදී රු. 492,939 ක් වටිනා ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගෙන තිබුණි. වර්ෂ 02ක් ගතවී තිබුණද විගණිත දිනය වූ 2015 ජුලි 17 දින වන විටත් මෙම ද්‍රව්‍ය හා උපකරණ ඌණ උපයෝජිතව දොඹගහවෙල පුස්තකාලයේ ගබඩා කර තිබුණි.

## 04. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය